www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වොෂින්ටනයේ දෙබිඩි පිලිවෙත: ඉරානයේ සහ ඇෆ්ගනිස්තානයේ මැතිවරන

## Washngton's double standard: The elections in Iran and Afghanistan

**2009 අගෝස්තු 28**

ක්‍රමානුකූලව සහ විශාල වශයෙන් සිදුකල මැතිවරන වංචාවන් පිලිබඳව තොරතුරු වඩ වඩා එලිදරව් වෙමින් තිබිය දීත්, අගෝස්තු 20 පැවැති ඇෆ්ගනිස්තානයේ ජනාධිපතිවරනය මූලිකව ප්‍රජාතන්ත්‍රවාදී කටයුත්තක් ලෙස මවා පෑමේ බොරුව පවත්වාගෙන යාමට ඔබාමා පාලන තන්ත්‍රය සහ ඇමරිකානු මාධ්‍ය තවමත් උත්සාහ කරති.

ඡන්ද අක්‍රමිකතාවන් පිලිබඳව පැමිනිලි 800 ට වඩා ලැබුනු බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පිටුබලය සහිත නිරීක්ෂන කන්ඩායමක් වන මැතිවරන පැමිනිලි පිලිබඳ කොමිෂම ප්‍රකාශ කලේ ය. ඒවායින් 50ක් ඡන්ද ප්‍රතිපල වෙනස් කිරීමේ ශක්‍යතාවන් සහිත බරපතල ඒවා ය.

ප්‍රමුඛ අභියෝග කරුවෙක් වන ඔහුගේ කලින් විදේශ ඇමති අබ්දුල්ලා අබ්දුල්ලා ඇතුලුව බලයේ සිටින ජනාධිපති හමීඩ් කර්සායිට විරුද්ධව ඉදිරිපත් වූ දුසිම් භාගයක් පමන අපේක්ෂකයෝ ඡන්ද වංචා කිරීම පිලිබඳව ආන්ඩුවට චෝදනා කරති. කර්සායි වෙනුවෙන් හිස් ඡන්ද පත්‍රිකා ලකුනු කරන සහ ඡන්ද මධ්‍යස්ථානවල දී ඡන්ද දායකයන්ට තර්ජනය කරන කර්සායිගේ ආධාරකරුවන් සහ මැතිවරන නිලධාරීන් පෙන්නුම් කරන වීඩියෝ පටයක් අගහරුවාදා අබ්දුල්ලාගේ මැතිවරන උද්ඝෝෂනයේ දී නිකුත් කලේ ය. කන්දහාර්වල දී ඔහු වෙනුවෙන් පාවිච්චි කරන ලද, නමුත් නිලධාරින් විසින් කුනුගොඩට දමා තිබී ඔහුගේ මැතිවරන උද්ඝෝෂනයේ දී සොයා ගත් බවට, ඔහු විසින් ප්‍රකාශ කල ඡන්ද පත්‍රිකාවලින් පිරුන බෑගයක් තවත් අපේක්ෂකයෙකු වූ මිර්වායිස් යසිනි ඉදිරිපත් කර ඇත.

වාඩිලාගෙන සිටින එක්සත් ජනපද-නේටෝ හමුදා සහ ඇෆ්ගන් ගරිල්ලන් අතර ලේවැකි ගැටුම් පවතින කන්දහාර් සහ හෙල්මන්ඩ් පලාත්වල සමහර ප්‍රදේශවල ඡන්දය පාවිච්චි කර ඇති සංඛ්‍යාව සියයට 5 සිට 10 දක්වා පමනක් බව විදේශීය මැතිවරන නිරීක්ෂකයෝ තක්සේරු කලහ. මෙම ප්‍රදේශවල සියයට 40 ඡන්දය පාවිච්චි කල බව කර්සායි තන්ත්‍රය ප්‍රකාශ කලේ ය. මෙම විශාල පරතරය මෙම ප්‍රදේශවල දී ක්‍රමානුකූලව හා විශාල වශයෙන් ඡන්ද මංකොල්ලය සිදු වූ බවට සාක්ෂියකි.

මැතිවරන වංචාවන් සහ අඩුවෙන් ඡන්ද පාවිච්චි කිරීම පිලිබඳව ඇගවීම් ඇමරිකානු මාධ්‍යයන් විසින් වාර්තා කල නමුදු සීමා සහිත වුවත් මහජන කැමැත්ත ප්‍රකාශ කල ත්‍රස්තවාදයට., එනම් තලිබාන් සංවිධානයට සම්බන්ධ කැරලිකරුවන්ට එරෙහි ජයග්‍රහනයක් ලෙස මැතිවරනය අනුමත කිරීමේ එක්සත් ජනපද නිල ආස්ථානය එයාකාරයෙන් ම නොවෙනස්ව තිබේ.

''ඔවුන්ගේ අනාගතය සියතට ගැනීමේ ඇෆ්ගන් ජනතාවගේ ප්‍රයත්නයේ දී මෙය වැදගත් ඉදිරි පියවරක් බව'' ප්‍රකාශ කරමින් අගෝස්තු 21 නිකුත් කල ප්‍රකාශයකදී ජනාධිපති ඔබාමා මැතිවරනයට සුබපැතුවේය.

මැතිවරන අක්‍රමිකතාවන් පිලිබඳව පුලුල්ව පැතුරුනු වාර්තා හුදෙක්ම ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනය වන වේදනාවන් බව ප්‍රකාශ කරමින්, තානාපති කාල් ඊකෙන්බෙරි, ඉහලම මිලිටරි අනදෙන්නා වන ජෙනරාල් ස්ටැන්ලි මැක්ක්‍රිස්ටල් සහ ඇෆ්ගනිස්තාන-පකිස්තාන කලාපයේ ප්‍රධාන එක්සත් ජනපද තානාපති රිචඩ් හොල්බෲක් යන සියලු දෙනාම එකහඬින් මැතිවරනයේ නීත්‍යානුකූලභාවය අනුමත කලහ.

මාස දෙකකට පෙර පැවති ඉරාන මැතිවරනය සම්බන්ධයෙන් එබඳු සමාව දෙන සුලු ප්‍රවිෂ්ටයක් නොවීය. ඡන්දය දීම ජුලි 12 අවසන් වූ වහාම ඉරානයේ ජනාධිපතිවරනය වංචනික එකක් ලෙස ඇමරිකානු මාධ්‍ය විසින් හෙලා දුටුවේ ය. ඔබාමා පාලන තන්ත්‍රය සහ යුරෝපීය බලයන් යන දෙකම ජනාධිපති මහමුඩ් අහමඩිනිජාඩ්ගේ යලි තේරී පත්වීමේ නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කලහ.

එහෙත්, ඇෆ්ගනිස්තානයට ප්‍රතිමුඛව ඉරාන විරුද්ධ පක්ෂය හෝ එහි ඇමරිකානු සගයෝ මැතිවරන වංචාවන් පිලිබඳව කිසිදු වැදගත් සාක්ෂියක් ඉදිරිපත්

කිරීමට අසමත් වූහ. හොර ඡන්ද දැමීම හෝ අහමඩිනිජාඩ් වෙනුවෙන් කලින්ම පුරවන ලද ඡන්ද ඡන්ද පෙට්ටි සම්බන්ධ වීඩියෝපට නොවීය. මෙය සිදුවූයේ රටේ සෑම ප්‍රදේශයක විරුද්ධ පක්ෂයේ සැලකිය යුතු මැදිහත්වීමක් තිබුන සහ ජංගම දුරකථන, වීඩියෝ පට සහ විද්‍යුත් පනිවුඩ යොදා ගනිමින් මැතිවරන අක්‍රමිකතාවයන් ප්‍රසිද්ධ කිරීමට ඇෆ්ගනිස්ථානයට වඩා විශාල වශයෙන් තාක්ෂනික සම්පත් තිබුන රටක් තුල ය.

දෙබිඩි පිලිවෙත සඳහා පැහැදිලි දේශපාලන හේතුවක් තිබේ. ඉරානයේ දී මැතිවරන වංචාවන් පිලිබඳ චෝදනා කිරීම සහ ඇෆ්ගනිස්ථානයේ දී එලිපිට කෙරුනු ඡන්ද මංකොල්ලය නොතකා හැරීම පිලිබඳ තීන්දුව කරා මෙහෙයවනු ලබන්නේ වොෂිංටනයේ සහ ඇමරිකානු මාධ්‍යයන්හි පවතින බව කියන ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම කෙරෙහි කැපවීම විසින් නොව, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතාවයන් පිලිබඳ විදේශ පිලිවෙත විසින් ය.

මැතිවරන වංචාවන් පිලිබඳ චෝදනාව යොදා ගනු ලැබුවේ පර්සියානු ගල්ෆ් ප්‍රදේශයේ සහ මධ්‍යම ආසියාවේ තෙල් සහ ගෑස් සම්පත් මත ග්‍රහනය ශක්තිමත් කර ගැනීමේ එහි සැලසුම්වලට බාධාවක් ලෙස වොෂිංටනය විසින් සලකනු ලබන අහමඩිනිජාඩ්ගේ ආන්ඩුව අස්ථාවර කිරීමට ය.

නිල ප්‍රතිපල කලින්ම අපකීර්තියට පත් කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන වැසීමට පෙරාතුව තමන් ජයග්‍රාහකයා බව ප්‍රධාන ඉරාක විරුද්ධ පක්ෂ අපේක්ෂක මීර්හොසේන් මවුසාවි විසින් ම ප්‍රකාශ කල විට ගනන් බලා කරන ලද ප්‍රකෝපකරනය පැහැදිලිවිය.

ඇෆ්ගනිස්තානයේ දී ඊට වඩා වෙනස් තත්ත්වයක් තිබීම උපදේශාත්මකය. මැතිවරනය අවසන් වූ වහාම කර්සායි සහ අබ්දුල්ලාගේ කඳවුරු ජයග්‍රහනය පිලිබඳ එකිනෙකාගේ ප්‍රකාශ නිකුත් කල විට හෝල්බෲක් අපේක්ෂකයන් දෙනොම මුනගැසී ඔවුන්ට ඉදිරියට යාමේ නියෝග නිකුත් කලේ යඃ එනම් ඡන්දවලින් වැඩි පදාසයක් කාබුල්වල දී නිල වශයෙන් සහතික කරන තුරු ජයග්‍රහනය පිලිබඳ ප්‍රකාශ නොකල යුතු ය.

හෝල්බෲක් වාර්තාකරුවන්ට මෙසේ පැවසුවේ ය. ''ඡන්ද ගනන්කරලා තියෙන්නේ සියයට දහයයි. සියයට දහයක් ඡන්ද ගනන් කර තිබෙන ඇමරිකානු මැතිවරනයක් ගැන උපකල්පනය කරන්න සියයට දහයක් ඡන්ද ගනන් කර තිබිය දී ඔබ ඒ ගැන කතා කරන්නේ නැහැ.'' ඉරානයේ දී එක්සත් ජනපදයේ පිටුබලය ලත් අපේක්ෂකයා ඡන්දය කිසිසේත්ම ගනන් කර නොතිබිය දී ඒ ගැන කතා කලේ හෝ රාජ්‍ය දෙපාර්තමේන්තුව ඒ ගැන විරෝධය පල නොකලේ ඇයිදැයි ඔහුගේ ප්‍රේක්ෂකයෝ ආචාරසම්පන්න ලෙස නොවිමසා සිටියහ.

ඔහුගේ ඇමරිකානු අනුග්‍රහකයන් විසින් දුර්වල, දූෂිත සහ බලරහිත පුද්ගලයෙකු ලෙස පලල්ව සලකනු ලබන ජනාධිපති කර්සායි සමග සම්බන්ධතාවය ආරවුල් සහගත වීම හේතු කොට ගෙන ඇෆ්ගනිස්තානයේ මැතිවරනයට සම්බන්ධිතව ඔබාමා පාලන තන්ත්‍රයේ පිලිවෙත සංකීර්න කරනු ලැබ ඇත. අබ්දුල්ලා සහ හිටපු මුදල් ඇමති අෂ්රෆ් ඝානි ඇතුලු අනෙකුත් ඇමරිකානු හෙංචයියන් ආන්ඩුවේ ඉහල තනතුරුවලට පත් කරමින් වඩාත් චාරිත්‍රානුකූල භූමිකාවකට කර්සායිව තල්ලු කර දැමීමට වොෂිංටනය වැඩි කැමැත්තක් දක්වන බව පෙනෙන්නට තිබේ.

මෙහි තේරුම එකහෙලාම මැතිවරනය දිනීමට අවශ්‍ය සියයට 50 ඡන්ද ප්‍රතිශතයක් කිසිසේත්ම ලබා ගැනීමට නොහැකි ආකාරයට ඡන්ද කොල්ලය සීමා කිරීම ය. ඒ අනුව ඔහුට අබ්දුල්ලා සමග තරග කර ඔහුගේ දේශපාලන අධිකාරයට සැලකිය යුතු පහරක් එල්ල කිරීමට බල කෙරෙනු ඇත. එහෙත් එක්සත් ජනපද පිටුබලය සහිත තන්ත්‍රය තුල, විශේෂයෙන් ම, අබ්දුල්ලාට විශාල වශයෙන් සහයෝගය දෙන ටජික් සුලුතරය සහ කර්සායිගේ ප්‍රධාන ආධාරකරුවන් වන වඩා විශාල පශ්තුන් ජනයා අතර වාර්ගික ආතතියක් ඇති කිරීමට එය තුඩුදිය හැකි නිසා මේ උපාමාරුව නිශ්චිතව ම අන්තරායකාරීය.

ඉරානයේ මැතිවරනය සම්බන්ධයෙන් එක්සත් ජනපද ප්‍රවිෂ්ටය සහ ඇෆ්ගනිස්තානය සම්බන්ධයෙන් එහි ප්‍රතිචාරය අතර ඉස්මතුවන තවත් ප්‍රතිරෝධයක් තිබේ. පැය ගනනකට පසු මවුසාවි ගේ ජයග්‍රහනය පිලිබඳ ප්‍රකාශය තිබුනේ වී නමුත්, ඡන්ද ප්‍රකාශ කිරීම අවසන් වී පැය කිහිපයකට පසු තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් අහමඩිනිජාඩ් යලි තේරී පත්වී ඇති බවට ඉරාන ආන්ඩුව කල ප්‍රකාශයේ සාපේක්ෂ කාල ගනනය ඇමරිකානු මාධ්‍ය උපුටා දැක්වීය.

නමුත් ඇමරිකානු මාධ්‍යවල අඩු අවධානය යොමු වූ ඒ හා සමාන ප්‍රකාශයක් කර්සායිගේ ප්‍රධාන ආධාරකරුවෙකු වූ මුදල් ඇමති හස්රාත් ඕමර් ශකිල්වාල් ඇෆ්ගනිස්තානයේ දී කලේ ය. ඡන්දය අවසන් වී දින තුනහමාරකට අඩු කාලයක දී, අගෝස්තු 23 කර්සායි සියයට 68ක් ඡන්දය ලබාගෙන ඇති බව ශකිල්වාල් මාධ්‍යවලට ප්‍රකාශ කලේ ය. කර්සායි මිලියන තුනක් ද අබ්දුල්ලා මිලියන 1.5ක් ද සෙසු අපේක්ෂකයන් ඊට අඩුවෙන් ද ඡන්ද ලබා ගත් බව ප්‍රකාශ කරමින් ඔහු සාපේක්ෂව නිශ්චිත ගනන් හිලව් ඉදිරිපත් කලේ ය. මිලියන 5ක් ඡන්දය පාවිච්චි කල අතර ගනන් කිරීමට ඉතිරිව තිබුනේ ඡන්ද 450,000 ක් පමනි.

ඊට දිනකට පසුව ස්වාධීන මැතිවරන කොමිෂම රට පුරා ඡන්ද මධ්‍යස්ථාන 6,000 ට වැඩ සංඛ්‍යාවකින්

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවන්ගේ නිරවද්‍යතාවය ගනනය කර තිබුනේ මධ්‍යස්ථාන 500ක පමනක් නමුත් ඇමතිගේ ප්‍රකාශයේ විකාර සහගත ස්වභාවය පිලිබඳව ඇමරිකානු මාධ්‍ය කිසිම සඳහනක් නොකලේ ය.

ඉරානයේ දී අහමඩිනිජාඩ් විසින් ජයග්‍රහනය පිලිබඳව කල ප්‍රකාශය විශාල ඡන්ද මගඩියක් කිරීමේ උත්සාහයක් ලෙස සලකන ලදී. ඇෆ්ගනිස්ථානයේ දී කල ඒ හා සමාන ප්‍රකාශ නොවැදගත් ලෙස සලකා ඉවත දැමුවේය.

මැතිවරන දෙක පිලිබඳව කෙරෙන සංසන්දනය ප්‍රජාතන්ත්‍රවාදය සහ මහජන ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජනපදයේ මවාපෑමේ ප්‍රෝඩාව එලිදරව් කරයි. රටවල් දෙකම මත ආධිපත්‍යය තබාගැනීමට උත්සාහ කරන ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් සාක්ෂි පිලිබඳ කිසිදු වගවිභාගයකින් තොර ව එක මැතිවරනයක් ප්‍රශංසාවට ලක් කරන අතර අනෙක හෙලාදකියි.

පැට්‍රික් මාටින් විසිනි

---

□ □□□.□□□□.□□□